# පරීක්ෂක වාර්තාව

## AA2 විභාගය - ජනවාරි 2020

## (AA26) ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග

---

**මෙම ප්‍රශ්න පත්‍රය A, B, C, D යනුවෙන් කොටස් හතරකින් යුක්තව ප්‍රශ්න 10 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලිවීම අනිවාර්ය වේ.**

### A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය අනුකොටස් 10 කින් සමන්විතය. එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි.

අංක **1.1** සිට **1.5** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරාගෙන තෝරාගත් උත්තරයට අදාල අංකය උත්තර පත්‍රයේ ලිවිය යුතුය. බහුතරයක් වූ අයදුම්කරුවන් දී ඇති උපදෙස් නිසිලෙස පිළිපදිමින් පිළිතුරු ඉදිරිපත්කර තිබූ අතර ඉතාමත් සුළු පිරිසක් අදාල උපදෙස්වලට අවධානය යොමු නොකර පිළිතුරු ඉදිරිපත්කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකයට අනුව උත්තර පත්‍රයේ සඳහන් කලයුතු වුවද ඇතැම් සුළු පිරිසක් තෝරාගත් උත්තරය පිළිතුරු පත්‍රයේම ලියා තිබුණි. තවද පහසුවෙන් ලකුණු ලබාගැනීමට හැකි ප්‍රශ්නයක් වුවත් පිළිතුරු ලිවීම මගහැර ඇති සරල අවස්ථාද දක්නට ලැබුණි.

ප්‍රශ්න අංක **1.6** සිට **1.10** දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය බව ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලිවීමට නියමව තිබුණි. අයදුම්කරුවන් බහුතරයක් සාර්ථකව උපදෙස් අනුගමනය කරමින් පිළිතුරු ඉදිරිපත්කර තිබූ අතර ඉතාමත් සුළු පිරිසක් සත්‍ය අසත්‍ය වෙනුවට √ හෝ × යන සංකේත ලකුණු යොදා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### B කොටස

**අනිවාර්ය ප්‍රශ්න 05 කි. එක් ප්‍රශ්නයකට ලකුණු 5 බැගින් ලබාගත හැකි මුළු ලකුණු 25 කි.**

### ප්‍රශ්න අංක 02

සංනිවේදනය පිළිබඳ ප්‍රශ්නයකි. සංනිවේදනය සඵලදායීවන්නේ එය නිවැරදිව ලබන්නා වෙත ලැබී තේරුම් ගැනීමෙන් පසු යවන්නා විසින් අපේක්ෂා කළ ආකාරයට ඒ ගැන කටයුතු කරමින් සංනිවේදන අරමුණු ඉටුවූ කල්හිය. මෙහි **(a) කොටසින්** සංවිධානයකට සඵලදායී සංනිවේදනයේ වාසි තුනක් සඳහන් කරන ලෙස ප්‍රශ්නයේ ඉදිරිපත් වී තිබුණි. ඉතාමත් පහසුවෙන් ලකුණු ලබාගත හැකි ප්‍රශ්ණකි. වාසි සහගත ඕනෑම යෝග්‍ය කරුණු තුනක් සඳහන් කිරීමෙන් ප්‍රශ්ණයට නියමිත ලකුණු ලබාගත හැකිය. බොහොමයක් අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු ලියා තිබුණද සමහරෙක් කරුණු 1 ක් හෝ 2 ක් සඳහා ලියා තිබූ අතර නියමිත ලකුණු ලබා ගැනීමට නොහැකි වී තිබුණි. මෙහි **(b) කොටසින්** සංනිවේදනයට ඇති බාධා දෙකක් පැහැදිලි කරන ලෙස දක්වා තිබිණි. ඇතැම් සිසුන් බාධා ලෙස කරුණු දෙකක් සඳහන් කළද එය පැහැදිලි කර නොතිබූ අවස්ථා දක්නට ලැබුණි. සමස්ථයක් ලෙස බොහොමයක් සිසුන් සාර්ථක පිළිතුරු ඉදිරිපත්කරමින් ලකුණු ලබාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **03**

පද්ධති න්‍යායට අනුව පද්ධතියක මූලිකාංග තුනක් පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත්කර තිබුණි. බහුතරයක් සිසුන් ප්‍රශ්නය අවබෝධ කරගෙන සාර්ථක පිළිතුරු ඉදිරිපත්කර තිබුණි. ඉතාමත් සුළු පිරිසක් ප්‍රශ්නය අවබෝධකර නොමැති බවත් විභාගයට පෙර සූදානම් වීමක් නොමැති බවත් නිරීක්ෂණය වූ අතර තවත් සමහරෙක් ප්‍රශ්ණයට පිළිතුරු ලිවීම මගහැර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **04**

කළමණාකරුවන් විසින් වෙනසක් හඳුන්වා දෙන විට ඒ සඳහා සේවකයන් විසින් බාධා ඇති කිරීමට හේතු තුනක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් දක්වා තිබුණි. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්ණයට අදාලවන ලෙස හේතූන් ඉදිරිපත්කර ඒවා පැහැදිලි කරමින් සාර්ථක පිළිතුරු සපයා ප්‍රශ්ණයට නියමිත මුළු ලකුණු ලබා ගැනීමට සමත් වී තිබුණි.

පිළිතුරු පරීක්ෂාවේදි හඳුනාගත හැකි වූ තවත් විශේෂ කරුණක් වූයේ වෙනස කෙරෙහි බාධා ඇතිකිරීමට හේතු වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් නොකර එක් ඡේදයක් තුළ කරුණු ඇතුලත් කරමින් විස්තර කර තිබීමයි. එවැනි සිසුන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධකර නොතිබුණු බව අනාවරණය විය. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නය සඳහා සාපේක්ෂව සිසුන් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **05**

සංස්කෘතික ජාලයේ මූලිකාංග 5 ක් සඳහන් කරන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා ඉතා අඩු මට්ටමේ ලකුණු ලබා තිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගත් අය ඉතාමත් අඩු මට්ටමක පැවතුණි. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නය අවබෝධ කර නොගෙන ඒ සඳහා අධ්‍යනය නොකර ඇති බව අනාවරණය විය. ඇතැම් සිසුන් ප්‍රශ්නය ඉදිරිපත් කර ඇති ආකාරය අනුව එහි ඇති කරුණු හුවා දක්වා පිළිතුර ලෙස ප්‍රශ්ණයේ තිබුණු වචන ලෙස ඉතිහාසය, නිෂ්පාදනය, වෙළඳපල තාක්ෂණය හා උපාය මාර්ග ආදී වචන ලියා තිබුණි. ඇතැම් අයෙක් සංස්කෘතිය විස්තර වන ඉතිහාසය ඇදහිලි විශ්වාස ආකල්ප ආදි මූලිකාංග ලෙස දක්වා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

උපාය මාර්ග හා සංස්කෘතිය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්ණයට සාර්ථක පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ බව හෙළිදරව් විය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගෙන ප්‍රශ්නයට පිළිතුරු ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳ අවබෝධය දුර්වල මට්ටමක පැවතුණි. ඇතැම් අයදුම්කරුවන් සංස්කෘතිය හා උපායමාර්ග දෙක වෙන වෙනම නිර්වචනය කර තිබූ අතර එහි සම්බන්ධතාව පැහැදිලි කර නොතිබූ නිසා ලකුණු ලබා ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. ඉතාමත්ම සුළු පිරිසක් සාර්ථක පිළිතුරු ඉදිරිපත්කර මුළු ලකුණු ලබාගත් අවස්ථාද දක්නට ලැබිණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

## C කොටස

**මෙම කොටස ප්‍රශ්න අංක 7 සිට 9 දක්වා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගත හැකි මුළු ලකුණු ප්‍රමාණය 30 කි.**

## ප්‍රශ්න අංක 07

සංවිධාන ව්‍යුහය ආශ්‍රිතව ඉදිරිපත් වී ඇති ප්‍රශ්නයකි. **(a) කොටසින්** සංවිධාන ක්‍රියාවලියේ පියවරයන් පැහැදිලි කරන ලෙසත් **(b) කොටසින්** හොඳ සංවිධාන ව්‍යුහයක වාසි දෙකක් පැහැදිලි කරන ලෙසත් දක්වා තිබුණි.

බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්ණය අවබෝධ කරගෙන සාර්ථකව පිළිතුරු ඉදිරිපත් කර සතුටුදායක ලකුණු ලබාගෙන තිබුණි. ඇතැම් අය සංවිධානයක් යන්නට නිර්වචන ඉදිරිපත් කරමින් දීර්ඝ ලෙස අදාල නොවන කරුණු ඉදිරිපත් කළ අවස්ථා දක්නට ලැබිණි. සමහර අයදුම්කරුවන් දෙවන කොටස සඳහා සංවිධානයක ක්‍රියාවලිය විස්තර කරමින් පිළිතුරු ඉදිරිපත්කළ අවස්ථාද තිබුණු අතර හොඳ සංවිධාන ව්‍යුහයක වාසි ඉදිරිපත්කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්ණය කොටස් දෙකකින් සමන්විත වූ අතර එහි **(a) කොටසින්** මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලි න්‍යාය පැහැදිලි කරන ලෙසටත් **(b) කොටසින්** සේවකයින් අභිප්‍රේරණය වී ඇති බව හඟවන සංඥා දෙකක් පැහැදිලි කරන ලෙසට දන්වා තිබුණි.

මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය තුළ සඳහන් අවශ්‍යතා 5 ක් කෙටියෙන් විස්තර කර උදාහරණ දැක්වීම රූපසටහන් මගින් උදාහරණ සහිතව දක්වා තිබීම මුළු ලකුණු ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් වේ. බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටස සඳහා සාර්ථකව පිළිතුරු ඉදිරිපත් කර උපරිම ලකුණු ලබාගෙන තිබුණි. පිළිතුරු පත්‍ර ඇගයීමේදී නිරීක්ෂණය වූයේ ධූරාවලියේ අවශ්‍යතාවයන් අතරට මානසික අවශ්‍යතාවය අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන තිබීමයි. එවැනි අවශ්‍යතාවයන් වෙනම හුවා දැක්වීමට අවශ්‍ය නොවනු ඇත.එය ආරක්ෂණ අවශ්‍යතාවය තුළම ඇතුලත් වී තිබිය යුතු කරුණක් ලෙස අවබෝධ නොකර තිබීම දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය විය.තවද ධූරාවලිය තුළ අවශ්‍යතා තෘප්තිමත් වන අනුපිළිවෙල ඇතැම් සිසුන් හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

මෙහි දෙවන කොටස සඳහා සම්පූර්ණ හා නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණේ සීමිත පිරිසක් පමණි. සේවකයෙකු හොඳ අභිප්‍රේරණ මට්ටමක සිටින්නේද යන්න තහවුරු කර ගැනීමට උපකාරීවන ප්‍රධාන සංඥාවන් සඳහන් කර නොතිබූ අතර ප්‍රධාන කරුණු තුළ ඇතුලත් අනුකරුණු සඳහන් කර තිබුණි. ඇතැම් සීමිත පිරිස් අභිප්‍රේරණයේ ලක්ෂණයන් මේ සඳහා පිළිතුරු ලෙස ගලපා ගැනීමට උත්සාහා දරා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

නායකත්වය පිලිබඳ ඉදිරිපත් කර තිබූ ප්‍රශ්නයකි. **(a) කොටසින්** සංවිධනයන් සඳහා නායකත්වය වැදගත් වන්නේ ඇයි දැයි යන්නට හේතු තුනක් විමසන්න යනුවෙන්ද,මෙහි **(b) කොටසින්** නායකයකු සතුව තිබෙන බල මූලාශ්‍ර දෙකක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි.

මෙහි පළමු කොටසට බහුතරයක් සිසුන් සාර්ථක පිලිතුරු සපයා තිබුනු අතර පැහැදිලි කිරීමද සාර්ථකය. නායකත්වය හා කළමණාකරු වෙන් කිරීමට සුළුතර අයදුම්කරුවන් පිරිසක් උත්සාහ කර තිබූ අතර මෙම ප්‍රශ්නය සඳහා 99% ක් පමණ සාර්ථක පිලිතුරු සපයා තිබුණි. නයකත්වයේ වැදගත්කම විෂය දැනිමට අමතරව තමන් සතු සාමාන්‍ය දැනීමෙන්ද පිලිතුරු සපයා තිබූ අතර බොහෝ පිළිතුරු අදාල පිළිතුරට ගලපා තිබුණි. එසෙම මෙම ප්‍රශ්නය විෂයට ප්‍රායෝගිකව ගැලපෙන පිළිතුරු සාර්ථකව සැපයිය හැකි ප්‍රශ්නයක් බව අනාවරණය විය.

මෙහි **(b) කොටසින්** නායකයෙකුට බලය ලැබෙන යන මූලාශ්‍ර පිළිබඳව සාර්ථක පිලිතුරු ලබාදි තිබුණි. බොහෝ අයදුම්කරුවන් දඬුවම් හා ත්‍යාග ලබාදීමේ බලය පිළිබඳව පිළිතුරු ලෙස සඳහන් කර තිබුණු අතරම නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී තිබුණු ප්‍රමාණය අවම සිසුන් පිරිසකි. සාර්ථකව පිළිතුරු සපයා ලකුණු ලබාගත් බහුතරයක් අයදුම්කරුවන් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධනය සතුටුදායකය මට්ටමක විය.**

## <u>D කොටස</u>

**අනිවාර්ය ප්‍රශ්නයකි. මුළු ලකුණු 25 කි.**

## ප්‍රශ්න අංක 10

සිද්ධි අධ්‍යන ප්‍රශ්නයකි. ඉදිරිපත් කර ඇති සිද්ධියට අදාලව පිලිතුරු සැපයීම සිදුකළ යුතුය. කොටස් 4 කින් සමන්විත ප්‍රශ්නයකි. පළමු කොටසින් ශදුඅත (SWOT) විශ්ලේශනය භාවිතා කරමින් **සීමාසහිත සුපිරි (පුද්ගලික) සමාගමේ** මෙහෙයුම් කෙරෙහි පරිසරයේ බලපෑම විමසන ලෙස දක්වා තිබුණි.

**(a) කොටස** ඉතාමත් පහසු ලෙස අයදුම්කරුවන්ට අවබෝධ කරගත හැකි ලෙස ඉදිරිපත් කර තිබූ සිද්ධියකි. සිද්ධිය ඇසුරෙන්ම ශක්තින්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනාගෙන එක් කරුණකට සිද්ධියේ සඳහන් කරුණු දෙක බැගින් වත් හඳුනාගෙන පිළිතුරු ඉදිරිපත් කල යුතුව තිබුණි. සිද්ධියට අදාල කරුණු එක් එක් විශ්ලේශනයට වෙන වෙනම ඉදිරිපත් කර තිබීම සාර්ථක පිළිතුරකි. බහුතරයක් සිසුන් මේ සඳහා සාර්ථකව පිළිතුරු ඉදිරිපත් කර වෙන්කල ලකුණු ලබාගෙන තිබුණි. සුළුතරයක් අවබෝධයකින් තොරව සිද්ධියෙන් බැහැර කරුණු ඉදිරිපත් කර ඇති අවස්ථා අනාවරණය විය.

**(b) කොටසින්** සිද්ධියට ආදල සමාගම සඳහා එලදායී තීරණ ගැනීම වැදගත් වන්නේ ඇයි දැයි යන්න හේතු තුනක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර තිබුණි. කරුණු සඳහන් කිරිම පමණක් කර තිබූ සිසුන්ට මේ සඳහා වෙන් කල මුළු ලකුණු ලබාගත නොහැකි විය. බහුතරයක් සාර්ථකව කරුණු ඉදිරිපත් කර තිබුනද ඇතම් අය පිළිතුරු ඉදිරිපත් කිරිම දුර්වල මට්ටමක පැවති බව අනාවරණය විය.

**(c) කොටසින්** අදාල සමාගමට සමූහතීරණ ගැනීමේ වාසි දෙකක් සඳහන් කරන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුනි. මේ සඳහා සිද්ධියෙන් කරුණු උපුටාගෙන හේතු දෙකක් සඳහන් කිරීම පමණක් ප්‍රමාණවත්ය. පැහැදිලි කිරිම් අවශ්‍ය නොවේ. ඇතැම් සිසුන් දිර්ඝ ලෙස විස්තරාත්මක කරුණු ලියා තිබූ අවස්ථා දක්නට ලැබුණි.

**(d)** කොටසින් ආයතනයට හොඳ පාලන ක්‍රියාවලියක් තිබීමේ වාසි 03 ක් සඳහන් කර තිබුණි. දී ඇති සිද්ධියට අදාලව පරිසරය විශ්ලේෂණය කර වාසි හඳුනාගැනීම ප්‍රමාණවත්ය.

**(e) කොටසින්** ආදල අයතනයට අචාරධර්ම සහිත සංස්කෘතියක් ඇති කල හැකි ක්‍රම තුනක් සඳහන් කරන ලෙස දක්වා තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් න්‍යායාත්මක දැනුම දී ඇති සිද්ධාන්තයට යොමුකර සාර්ථක පිළිතුරු සපයා ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායකය මට්ටමක විය.**

- - -

<u>**අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:**</u>

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදි කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබිම ගැන සැළකිලිමත් විය යුතුය.

(8) ඒඒටී ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට විභාගයට මුහුණ දීම.

- * * * -